# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1706/10 - 2011 මැයි 16 වැනි සඳුදා - 2011.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ, පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2011 අංක 01 දරන ඌව පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2011 පෙබරවාරි මස 24 වැනි දින සම්මත කරන ලදුව 2011 මාර්තු 01 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
පළාත් සභා ලේකම්,

2011 මැයි මස 02 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි,
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාව**

***2011 අංක 1 දරන ඌව පළාත් සභා ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය***

ඌව පළාතේ ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල හා ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල හා පළාත් බල මණ්ඩලය පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම විධිවිධාන සැලැස්වීමට ද, ඊට සම්බන්ධ හෝ අනුෂාංගික හෝ කරුණු සඳහා විධි විධාන සැලැස්වීම සඳහා ද 2001 අංක 06 දරන ඌව පළාතේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය පරිච්චින්න කිරීම සඳහා වූ ප්‍රඥප්තියයි.

1A - PG 001242—340 (2011/05)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාත් සභාවේ 2011 අංක 1 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දින සිට හෝ නියම කරන පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වේ.

පරමාර්ථය හා කාර්යයන්

2. ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික් මට්ටම් හා පළාත් මට්ටමින් ග්‍රාම සංවර්ධන ආයතන සංවිධානය කිරීම හා ලියාපදිංචි කර පවත්වාගෙන යාම තුළින්, ග්‍රාමීය ජනතාවගේ සමාජ, ආර්ථික හා අධ්‍යාත්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

2.1 ග්‍රාමීය ජනතාව ගම් ප්‍රදේශ සංවර්ධන කාර්යයෙහිලා ක්‍රියාකාරීව නියැලීම සාක්ෂාත් කිරීම.

2.2 ග්‍රාමීය ජනතාව සංවර්ධන ක්‍රියාවලියේ සැලසුම්කරණයට හා තීරණ ගැනීමේ ක්‍රියාකාරී සහභාගීත්වයට හවුල්කරුවන් කර ගැනීම.

2.3 ග්‍රාමීය නායකත්වය භාරගැනීමට හා ප්‍රජා සේවාවන්හි නියමුවන් වීමටත්, සරිලන ලෙස ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීම හා බලගැන්වීම.

2.4 ග්‍රාමීය කාන්තාවන්ගේ සහජ කුසලතාවයන් කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන හරහා එළිදැක්වීම තුළින් ඔවුන්ගේ සමාජ හා ජීවන තත්වය ඔප් නැංවීම හා එයින් කාන්තා අභිවෘද්ධිය සාක්ෂාත් කිරීම.

2.5 ග්‍රාමීය තරුණ කොටස් ඵලදායී ලෙස ප්‍රාදේශීය සංවර්ධන කටයුතුවල සක්‍රීය කොටස්කරුවන් බවට පත්කිරීම.

2.6 නව සංවර්ධන ප්‍රවණතාවයන් හා උපාය මාර්ග හඳුන්වාදීම හා ස්ථාපනය කිරීම සඳහා ග්‍රාමීය තරුණ කොටස් විපර්යකාරකයන් බවට පත් කිරීම.

2.7 පළාතේ යෞවන යෞවනියන්ගේ ප්‍රතිභාවන් ඉස්මතු කර ගැනීම සඳහා යෝග්‍ය වන්නාවූ ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යාම.

ග්‍රාම සංවර්ධන සමිති හා බල මණ්ඩල ව්‍යවස්ථාව

3. මෙම ප්‍රඥප්තිය අනුව පිහිටුවනු ලබන ග්‍රාම සංවර්ධන සමිති හා අනෙකුත් බල මණ්ඩල වෙනුවෙන් පළාත් අමාත්‍යාංශයෙන් සැපයෙන ආදර්ශ ව්‍යවස්ථා මාලා අදාල සංවිධානවල මහා සභා රැස්වීමකදී සභා සම්මත කර ගත යුතුවේ.

ග්‍රාම සංවර්ධන සමිති හා අනෙකුත් බල ප්‍රදේශ

4. ග්‍රාම සංවර්ධන සමිතියක බල ප්‍රදේශය ග්‍රාම නිලධාරී බල ප්‍රදේශයක් ඉක්ම නොවිය යුතුය. එකම ග්‍රාම නිලධාරී වසමක් තුළ ආර්ථික, සමාජීය හා භූගෝලීය වශයෙන් අනන්‍යතාවයක් ඇති ගම් හෝ වතු ජනාවාස ඒකකයක් සඳහා ග්‍රාම සංවර්ධන සමිති වෙන වෙනම පිහිටුවාගත හැකිය. යම් කිසි විශේෂ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වූ විට ග්‍රාම නිලධාරී වසම් එකක් හෝ වැඩි ගණනක් ග්‍රාම සංවර්ධන සමිති බල ප්‍රදේශය ලෙස හඳුනාගත හැකිය.

4.1 එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා අනිවාර්යෙන්ම එක් ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බලමණ්ඩලයක් පිහිටුවිය යුතුය.

4.2 යම් දිස්ත්‍රික් බලමණ්ඩලයක බල ප්‍රදේශය වන්නේ අදාල පරිපාලන දිස්ත්‍රික්කයයි.

4.3 පළාත් බල මණ්ඩලය ස්ථාපිත කළ යුතුය. මෙහි කාර්යභාරය ප්‍රාදේශීය බලමණ්ඩල දිස්ත්‍රික් බලමණ්ඩල හරහා ස්වයං රැකියා ආධාර පිරිනැමීම, ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුදල් රැස්කිරීම හා සක්‍රීයව කටයුතු කිරීම.

4.4 පළාත් බල මණ්ඩලයක බල ප්‍රදේශය වන්නේ අදාල පරිපාලන දිස්ත්‍රික්ක වල එකතුවකි.

4.5 අදාල පළාත් බලමණ්ඩල ව්‍යවස්ථාව කෙටුම්පත.

*ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල ව්‍යවස්ථා මාලාව*

1. නාමය :- මෙම බලමණ්ඩලය ඌව පළාත් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලය යනුවෙන් හැඳින්වේ.

2. කාර්යාලීය :- ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය, ඌව පළාත් සභාව, බදුල්ල.

3. බල ප්‍රදේශය :- ඌව පළාතට අයත් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක 02

4. පරමාර්ථය :- පොදු සංවර්ධන කාර්යයන් ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් සංවිධානය වූ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය තුලින් ජනතාවගේ සාමූහික ශ්‍රමය, හැකියාව හා දක්ෂතාවයන් පදනම් කර ගනිමින් නව තාක්ෂණ දැනුම හා යටිතල පහසුකම් ලබාදී තරුණ පරපුරේ කුසලතා දියුණු කරමින් ආදායම් උත්පාදන මාර්ගවලට යොමු කර ඔවුන්ගේ ආර්ථික, සමාජ, සංස්කෘතික සංවර්ධනය ඇති කිරීමට දායකවීම සඳහා දිස්ත්‍රික්ක බලමණ්ඩල හා ප්‍රදේශීය බලමණ්ඩල හරහා කටයුතු කිරීම හා පළාත් බලමණ්ඩල අරමුදලක් ආරම්භකර දෙස් විදෙස් අරමුදල් රැස්කර ප්‍රදේශීය සංවර්ධනයට සෘජු දායකත්වයක් ලබා දීම.

5. අරමුණු :-

5.1 දිස්ත්‍රික්ක බලමණ්ඩල පිහිටුවීම හා සවිබල ගැන්වීමට සහය වීම.

5.2 ප්‍රදේශීය බලමණ්ඩල පිහිටුවීම හා සවිබල ගැන්වීමට සහය වීම.

5.3 ඌව පළාත තුළ පිහිටුවා ඇති ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා සමිතිවල අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

5.4 ග්‍රාමීය සංවර්ධනයේ දී සම්බන්ධවන රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හා සම්බන්ධ වී එම ආයතන දිස්ත්‍රික්ක බලමණ්ඩල, ප්‍රදේශීය බලමණ්ඩල හා සම්බන්ධීකරනය කිරීම.

5.5 දේශීය/විදේශීය ආයතන අත්දැකීම් හුවමාරු කර ගනිමින් ග්‍රාමීය සංවර්ධනයේ දී ප්‍රමුඛ කාර්‍යභාරයක් ඉටු කරලීම සඳහා දිස්ත්‍රික්ක බල මණ්ඩල/ප්‍රදේශීය බල මණ්ඩල සවිබල ගැන්වීම.

5.6 ප්‍රජා සංවර්ධන ප්‍රවේශය වෙනුවට ඉලක්ක කණ්ඩායම් සමග ග්‍රාමීය දිළිඳුකම අවම කිරීමට හා යටිතල පහසුකම් සංවර්ධනයට සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පර්යේෂණ/පරීක්ෂණ හා පුහුණු කිරීමේ කටයුතු කිරීමට සැලසුම් කිරීම හා මෙහෙය වීම.

5.7 පටු වාදභේදවලින් තොරව ග්‍රාමීය සංවර්ධනය සඳහා දායක වන නීතිය සාමය අගයන සාමූහික සහජීවනයකින් යුතු සමාජ ක්‍රමයක් ඌව පළාත තුළ ඇති කිරීමට කටයුතු කිරීම.

5.8 පළාත් අරමුදල සඳහා අරමුදල් රැස්කිරීම හා ඒවා ග්‍රාම සංවර්ධන කාර්යයන් සඳහා විධිමත් නීත්‍යානුකූල ක්‍රියාපිළිවෙතක් අනුව ප්‍රදේශීය බලමණ්ඩලවලට ලබා දීම.

6. සාමාජිකත්වය :-

6.1 මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්ක බලමණ්ඩල දෙකෙහි ගරු සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන නිලධාරීන් 06 දෙනා.

6.2 විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන නියෝජිතයින් 06කි. දිස්ත්‍රික්ක 02 සඳහා තිදෙනා බැගිනි.

6.3 මෙම පළාත් බලමණ්ඩල සඳහා රාජ්‍ය පාර්ශ්වයෙන් පහත සඳහන් නිලධාරීන් නිල බලමණ්ඩලයේ උපදේශකවරුන් වශයෙන් කටයුතු කරනු ඇත.

1. අමාත්‍යාංශයේ විෂයභාර ලේකම්
2. සහකාර අධ්‍යක්ෂ (ග්‍රාම සංවර්ධන)
3. දිස්ත්‍රික් නිලධාරීන් 02 (ග්‍රාම සංවර්ධන)

7. සාමාජිකත්වය ලබා ගැනීම :-

7.1 දිස්ත්‍රික් බලමණ්ඩල ලියාපදිංචි කිරීමෙන් පසු දිස්ත්‍රික් නිලධාරීන් දෙදෙනාගේ නිර්දේශ සහිතව ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම.

7.2 විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ලිඛිතව නම් කිරීම තුළින්

8. සාමාජිකත්වය අත්හිටුවීම :-

8.1 දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලයේ සාමාජිකත්වය අහිමිවීම.

8.2 නියමිත කාල සීමාව තුළ දිස්ත්‍රික් බලමණ්ඩලයේ නිලධාරීන් පවත්නා දිස්ත්‍රික් බලමණ්ඩලය යාවත්කාලීන කර නොතිබීම.

8.3 ගරු විෂයභාර ඇමතිතුමා විසින් නම් කරනු ලබන නියෝජිතයන්ගේ පත් කිරීම අවලංගු කිරීම.

8.4 ඌව පළාත තුළ ස්ථිර පදිංචිය නොමැතිකම.

8.5 මරණය සිදුවීම.

8.6 පළාත් බලමණ්ඩලයේ පරමාර්ථ හා අරමුණුවලට පටහැනි ආකාරයට කටයුතු සිදුකිරීම, ඔප්පු කිරීම තුලින්.

8.7 අධිකරණයෙන් වරදකරුවෙකු බවට තීන්දුකර දඬුවම් ලැබීම.

8.8 වර්ෂ 02 නිළකාලය අහෝසි වීම.

9. නිළකාලය :-

පළාත් බලමණ්ඩලයේ නිළකාලය වසර 02කි. වසර 02 ඉක්ම වී මාස 03ක් ඇතුළත පළාත් බලමණ්ඩලය පිහිටුවිය යුතුය.

එහෙත් පිහිටුවන ලද පළාත් බලමණ්ඩලයේ නිළකාලය ඉක්මවීමට පෙර අක්‍රීය වී ඇත්නම් හෝ බලමණ්ඩලයේ පොදු පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත් වී ඇති බවට දිස්ත්‍රික් බලමණ්ඩල 02ක හා ප්‍රාදේශීය බලමණ්ඩල 26න් 2/3ක් ඉල්ලීමකට අනුව පළාත් බලමණ්ඩලය අහෝසිකර නැවත පිහිටුවීම පිළිබඳ තීරණයක් ගැනීම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත ලේකම්වරයාට සිදුකළ හැකිය.

10. සභා රැස්වීම :-

10.1.1 සංවත්සරය
පළාත් බලමණ්ඩල පිහිටුවා හෝ ආරම්භක රැස්වීමේ සිට සෑම වසර 02ක් ඉක්මවූ පසු මාස 03ක් ඇතුළත පළාත් බලමණ්ඩල සංවත්සර රැස්වීම පැවැත්විය යුතුය.

10.1.2 මේ සඳහා ක්‍රියාත්මකව ඇති නිළකාලය අවසන් නොවූ දිස්ත්‍රික් බලමණ්ඩල 02 සඳහා දින 14කට පෙර ලිඛිතව දැනුම් දිය යුතුය.

10.1.3 ගරු විෂයභාර අමාත්‍යවරයාට දින 14කට පෙර ලිඛිතව දැනුම් දිය යුතුය.

10.1.4 දිස්ත්‍රික් බල මණ්ඩල අක්‍රීයව පවතින අවස්ථාවකදී නැවත ඒවා යාවත්කාලීන කිරීම සිදුවන තෙක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි පවතින පළාත් බලමණ්ඩලයේ නිළකාලය මාස 06කට දීර්ඝ කිරීමේ හැකියාව.

10.2.1 මහාසභා රැස්වීම් පැවැත්වීම
යටත් පිරිසෙන් මාස 03කට වරක් පළාත් බල මණ්ඩලයේ රැස්වීමක් පැවැත්විය යුතුය. මෙම රැස්වීම සඳහා සාමාජිකයින් දැනුවත් කිරීම දින 07කට පෙර ලිඛිතව සිදුකළ යුතුය.

10.2.2 විශේෂ මහාසභා රැස්වීම් පැවැත්වීම
අත්‍යාවශ්‍ය අවස්ථාවකදී, අමාත්‍යාංශ ලේකම්වරයාගේ දැනුම් දීම හෝ බලමණ්ඩලයේ සභාපතිවරයාගේ ඉල්ලීම අනුව හෝ සාමාජිකයින්ගෙන් 2/3 ඉල්ලීම අනුව විශේෂ මහාසභා රැස්වීමක් දින 07ක් ඇතුළත කැඳවිය හැකිය.

10.2.3 කාරකසභා රැස්වීම්
මාසයකට වරක් කාරක සභා රැස්වීමක් කැඳවිය යුතුය. කාරක සභා රැස්වීම් පැවැත්වීමේදී දින 05කට පෙර ලිඛිතව සාමාජිකයන් දැනුවත් කළ යුතුය.

10.2.4 විශේෂ කාරකසභා රැස්වීම්
අත්‍යාවශ්‍ය අවස්ථාවකදී හෝ අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීම මත හෝ සභාපතිවරයාගේ දැනුම් දීම මත විශේෂ කාරකසභාවක් දින 02ක් ඇතුළත කැඳවිය හැකිය.

10.2.5 ඉහත සඳහන් සියළුම රැස්වීම් පැවැත්වීමේදී අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කළයුතු අතර එම රැස්වීම් සඳහා අමාත්‍යාංශ ලේකම්, ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන්ට ලිඛිතව දැනුම් දිය යුතුය.

11. සනපූරනය
මහාසභා හෝ කාරකසභා රැස්වීමට සාමාජිකත්වයෙන් 1/3ක්ද, සංවත්සර සභා රැස්වීමක් සඳහා සාමාජිකත්වයෙන් 2/3ක සහභාගීත්වයක් ද අවශ්‍ය වේ.

12. යෝජනා
මහාසභා රැස්වීමක් සඳහා ඉදිරිපත් කරන යෝජනා මහාසභා රැස්වීමක් පැවැත්වීමට සති 02කට පෙර ලේකම්වරයා වෙත ලිඛිතව යොමු කළ යුතුය.

13. නිලධාරීන්
ආරම්භක මහාසභා රැස්වීමේදී හෝ සංවත්සරසභා රැස්වීමේදී 12ක් වූ ක්‍රියාකාරී මණ්ඩලයෙන් පහත සඳහන් නිලධාරීන් සම්මුතියෙන් හෝ ඡන්දයකින් තෝරා පත්කර ගත යුතුවේ.

(i). සභාපති 01
(ii). ලේකම් 01
(iii). භාණ්ඩාගාරික 01
(iv). උප සභාපති 01
(v). උප ලේකම් 01
(vi). ගණන් පරීක්ෂක 01

සෙසු සාමාජිකයින් 06 දෙනා කාරක සභිකයන් වේ.

13.1.1 භාරකාර මණ්ඩලය
පළාත් බලමණ්ඩලයේ භාරකාර මණ්ඩලය වශයෙන් සංගමය නියෝජනය කරමින් ගරු සභාපති/ලේකම්/භාණ්ඩාගාරික යන තිදෙනා පුද්ගලික නාමයෙන්ද රජය නියෝජනය කරමින් පළාත් අධ්‍යක්ෂ හා අමාත්‍යාංශ ලේකම්වරයා යන 05 දෙනා කටයුතු කරනු ඇත.

13.1.2 අනුශාසක
බලමණ්ඩලයේ අභිමතය පරිදි ග්‍රාම සංවර්ධන කාර්යයන්හි නියුතු අයෙකු අනුශාසකවරයෙකු වශයෙන් පත්කර ගත හැකිවේ.

13.1.3 උපදේශක
ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්/සහකාර අධ්‍යක්ෂ/දිස්ත්‍රික් නිලධාරීන් දෙදෙනා මෙම බලමණ්ඩලයේ උපදේශකවරුන් වශයෙන් කටයුතු කරනු ඇත. පළාත් බලමණ්ඩලයේ පරමාර්ථයන්ට පටහැනි නොවන

ආකාරයට මණ්ඩලයේ දියුණුවට අදාල කටයුතු පිළිබඳ උපදෙස් දීම හා සංගමය සතු පොත්පත් පරීක්ෂා කිරීම, රැස්වීම්වලට සහභාගීවීමට මෙම නිලධාරීන්ට බලය තිබේ.

13.1.4 නිලධාරීන්ගේ වගකීම් :

1. *සභාපති* - බලමණ්ඩලයේ මූලාසනය ගැනීම හා බලමණ්ඩලයේ දියුණුවට අදාල කටයුතු මෙහෙයවීම හා සාමූහිකත්වය රැකගනිමින් ග්‍රාම සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

2. *ලේකම්* - ලේකම්වරයා විසින් පහත සඳහන් පොත්පත් හා ලේඛන පවත්වාගෙන පහත සඳහන් ආකාරයට කටයුතු කළ යුතුය :–

   2.1 මහාසභා, කාරකසභා, සංවත්සර මහා සභා, විශේෂ කාරක සභා රැස්වීම් වාර්තා පිරිසිදුව ක්‍රමවත්ව තබාගැනීම.

   2.2 සමිති රැස්වීම් නියමිත පරිදි කැඳවීම ;

   2.3 සභා තීරණ ක්‍රියාත්මක කිරීම ;

   2.4 නිල මුද්‍රාව ඇතුළු ලැබෙන, යැවෙන ලිපි පිළිබඳ කටයුතු. ;

   2.5 පළාතට අදාල ග්‍රාම සංවර්ධන ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්න හා තොරතුරු වෙන්කර තබා ගැනීම.

3. *භාණ්ඩාගාරික* – සමිතිය සතු මුදල් වත්කම් පිළිබඳ වගකීම භාණ්ඩාගාරික සතුවේ. සභා රැස්වීම්වල දී හෝ සංවත්සර සභා රැස්වීම්වල දී සංගමයේ අයවැය පිළිබඳ ලේඛනයක් ගණන් පරීක්ෂකගේ නිර්දේශ ඇතුළත්ව සභාවට ඉදිරිපත් කිරීම හා අමාත්‍යාංශ ලේකම්/සහකාර අධ්‍යක්ෂ/දිස්ත්‍රික් නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම.

4. *උපසභාපති* – සභාපතිවරයාට සහය වීම හා නොමැති අවස්ථාවක දී ඔහු වෙනුවෙන් කටයුතු කිරීම.

5. *උපලේකම්* – ලේකම්වරයාට සහය වීම හා නොමැති අවස්ථාවක දී ඔහු වෙනුවෙන් කටයුතු කිරීම.

6. *ගණන් පරීක්ෂක* – භාණ්ඩාගාරිකවරයා විසින් සකස් කරනු ලබන අයවැය වාර්තාවන් පරීක්ෂා කිරීම, නිවැරදි කිරීම, බලමණ්ඩලයේ දේපල පිළිබඳ පරීක්ෂා කිරීම හා වාර්තා නිවැරදි බවට සහතික කිරීම කළ යුතුය.

7. *කාරක සභිකයන්* – පළාත් බලමණ්ඩලයේ දියුණුවට අදාලව බලමණ්ඩලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවලදී සහය දැක්වීම කාරක සභිකයන්ගේ වගකීම වේ.

14. *අරමුදල්* :
පහත සඳහන් ආකාරයට සංගමයට අරමුදල් සපයා ගත හැකිය :–

1. ගරු මන්ත්‍රීවරුන්ගේ හා ඇමතිවරුන්ගේ ප්‍රතිපාදන අනුව සංවර්ධන කටයුතු සඳහා ලබාගන්නා මුදල් ;

2. සංගමය සතු අරමුදල් ව්‍යාපෘති සඳහා නිදහස් කිරීමෙන් ලබාගන්නා පොලී මුදල් ;

3. බලමණ්ඩලයේ අභිමතය පරිදි නීතිරීතීන්ට යටත්ව සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කරමින් රැස්කර ගන්නා මුදල් ;

4. රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හා පරිත්‍යාගශීලීන්ගේ පරිත්‍යාග ;

5. ඌව පළාත තුළ අක්‍රියව ඇති ග්‍රාම සංවර්ධන සමිති සතු අරමුදල් පළාත් අරමුදලට බැරකර ගත හැකිය.

15. අරමුදල් පාලනය
බලමණ්ඩලය සතු මුදලින් රු. 1,000 ක (දහසක) මුදලක් භාණ්ඩාගාරිකවරයාගේ අත තබාගත හැකිවේ. ඉතිරි මුදල් සංගමය නමින් රාජ්‍ය බැංකුවක තැන්පත් කළ යුතුවේ. මුදල් පාලනය සඳහා ගරු සභාපති/ලේකම්/භාණ්ඩාගාරික යන නිලධාරීන්ගේ හා ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ හා විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අත්සන් යෙදවීමටත්, මුදල් ගැනීමේ දී භාන්ඩාගාරික ඇතුළුව සභාපති හෝ ලේකම්වරයාගේ අත්සන් දෙකක් ද සහකාර අධ්‍යක්ෂ (ග්‍රාම සංවර්ධන) හෝ විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අත්සන ද පිළිගැනීමට අදාල බැංකුවට බලය දිය යුතුවේ.

16. ව්‍යවස්ථා සංශෝධනය කිරීම
තත්කාලීන ව්‍යවස්ථානුකූලව පවත්වනු ලබන මහා සභා රැස්වීමක දී 2/3ක හෝ ඊට වැඩි සාමාජිකයන්ගේ කැමැත්ත ඇතිව ව්‍යවස්ථා සංශෝධනය හෝ අභිනව ව්‍යවස්ථා පැනවීම කළ හැකිය. එසේ අනිවාර් යෙන්ම කරනු ලබන ව්‍යවස්ථා හෝ සංශෝධනය ක්‍රියාත්මක කිරීමට විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුවේ.

5. ග්‍රාම සංවර්ධන සමිතිය : ග්‍රාම සංවර්ධන සමිතියක කාර්යභාරය.

5.1 ගමේ ඇති ස්වාභාවික සම්පත් හා මානව සම්පත් විශ්ලේෂණාත්මක අධ්‍යනයකින් හඳුනාගැනීම

5.2 ග්‍රාමීය සම්පත් උපයෝගී කරගෙන කෙරෙන නිෂ්පාදන ක්‍රියාවලියක දී –

(අ) මතුවන නිෂ්පාදන ගැටළු,
(ආ) නිමි ද්‍රව්‍ය අලෙවිකරණයේ ගැටළු විසඳා ගැනීමෙහිලා ව්‍යවසායකත්වය දැනුවත්කම් වැඩි දියුණු කිරීම.

5.3 පවත්නා ග්‍රාමීය ආදායම් මාර්ග ඵලදායි කිරීමත් නව ප්‍රවණතා අඳුනා ගැනීම සඳහා ජනතාව ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම.

5.4 සම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රියාවලිය වඩා ඵලදායි කිරීමට අඳුනාගෙන ඇති නව තාක්ෂණ හා ක්‍රම වේදයන් ග්‍රාමීය ජනතාව වෙත ගලාඒමේ ක්‍රියාවලිය අර්ථවත් කිරීම.

5.5 සැලසුම්කරණය හා ක්‍රම සම්පාදන ක්‍රියාවලියෙහි මූලධර්ම ග්‍රාමීය ජනතාවගේ ප්‍රායෝගික දැනුමේ හරය බවට පත්කිරීම.

5.6 ඉහත දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් රැස්කිරීම.

6. ප්‍රාදේශීය බල මණ්ඩල :

6.1 ග්‍රාම සංවර්ධන සමිති නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදේශාත්මක සේවා ලබාදීම. ප්‍රාදේශීය බල මණ්ඩලවල කාර්යභාරය

6.2 ග්‍රාම සංවර්ධන සමිති කාර්යයන් සවිමත් කිරීමට අවශ්‍ය වන අරමුදල් ගොඩනගා ගැනීමට උපදෙස් දීම.

6.3 ප්‍රාදේශීය සැලසුම් සම්පාදනයේ දී ග්‍රාම සංවර්ධන සමිතිවලට යෝජනා ඉදිරිපත් කිරීමට හා සහභාගිවීමට අවස්ථාව සැලසීම.

6.4 ප්‍රාදේශීය මට්ටමේ ග්‍රාම සංවර්ධන සමිති අතර අන්තර් සම්බන්ධතා දියුණු කරලීම.

7. ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩල :

7.1 ග්‍රාම සංවර්ධන සමිති හා ප්‍රාදේශීය බලමණ්ඩලවල පරමාර්ථයන් ඉටුකර ගැනීමට අවශ්‍ය උපදේශාත්මක සේවාවන් සැපයීම. ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලවල කාර්යභාරය

7.2 රජයේ ආයතන හා රාජ්‍ය නොවන සංවිධානවල නොමසුරු සහාය අදාළ පාර්ශවයන්ට ලබාගත හැකිවන පරිදි යහපත් අන්තර් සහයෝගිතා අවබෝධයන් වැඩි දියුණු කිරීම.

7.3 දිස්ත්‍රික් සංවර්ධනයේ දී ග්‍රාම සංවර්ධන සමිති අත්දැකීම් උපයෝගී කර ගැනීමේ සාර්ථක ක්‍රමවේදයන් හඳුන්වා දීම.

7.4 සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයෙහි විපුල ප්‍රයෝජන සැලසුම්කරණය හා මෙහෙයවීම මගින් ජනතාව තුල විශ්වාසයක් ගොඩනැගීම.

ග්‍රාම සංවර්ධන සංවිධාන අරමුදල

8. ඌව පළාත් බල මණ්ඩලයේ කාර්යභාරයන් :

8.1 තමාගේ කාර්යයන් ඉටුකරගැනීමේ අරමුණින් සෑම ග්‍රාම සංවර්ධන සමිතියක්ම අරමුදල් ආරම්භකොට පවත්වාගත යුතුවේ.

8.2 ප්‍රාදේශීය බල මණ්ඩලයේ මූලික අවශ්‍යතා සඳහා එම සංවිධානයේ සාමාජික ග්‍රාම සංවර්ධන සමිති තමාගේ අරමුදල්වලින් නිශ්චිත භාරයක් ප්‍රදානය කිරීමෙන්, ප්‍රාදේශීය බල මණ්ඩල තුළ තම සමිතියේ සාමාජිකත්වය තහවුරු කරගත යුත්තේ ය.

පළාත් දෙපාර්තමේන්තු සංවිධානය කිරීම හා කාර්ය මණ්ඩලය.

9. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 09 වැනි උපලේඛනයේ 01 වැනි ලැයිස්තුවේ සඳහන් ග්‍රාම සංවර්ධන විෂය කළමනාකරණය සඳහා මෙතෙක් යොදවා ගන්නා ලද සියලුම කාර්ය මණ්ඩලයන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට පළාත් රාජ්‍ය සේවාවෙහි නිලධාරීන් ලෙස හඳුනා ගනු ලැබේ.

පළාත් අධ්‍යක්ෂ.

10.1 ඌව පළාත් සභාව විසින් ග්‍රාම සංවර්ධන විෂය කළමනාකරණය කිරීම සඳහා පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයෙකු හා අදාළ දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය අවශ්‍යතාවය පරිදි පත්කර ගත යුතුය. පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වන්නේය.

10.2 මෙම නිලධාරීන් පළාතේ ආණ්ඩුකාරවරයා විසින් හෝ නිසි බලයලත් බලධාරියෙකු විසින් පත්කරනු ලැබේ.

10.3 ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අමාත්‍යාංශ ලේකම්වරයා තීරණය කරනු ලබන අතර දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු වන්නේ ය.

දණ්ඩනීති සංග්‍රහය අදාල බව

11. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පත් කරන ඌව පළාත් රාජ්‍ය සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ නිලධාරීන් ලෙස සලකනු ලැබිය යුතුය.

12. මෙම ප්‍රඥප්ති විධිවිධාන යටතේ පත්කරන ලද සියලුම නිලධාරීන් තම බලතල හා වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හෝ නිකුත් කරනු ලබන පොදු වූ ද විශේෂ වූ ද නියෝගවලට හා විධිවිධානවලට අනුකූලව ක්‍රියාකළ යුතු ය.

දෙපාර්තමේන්තුවේ ගිණුම

13. දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් පිරිමසා ගැනීමට පළාත් සභා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කරවා ගත යුතුය.

ග්‍රාම සංවර්ධන ප්‍රවර්ධන කටයුතු සඳහා ලැබෙන වෙනත් ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

14. පහත සඳහන් සියලු බැරකම් ඌව පළාත් බල මණ්ඩල නමින් පවතින ගිණුමට බැර කළ යුතු වන්නේය :–

(අ) රජයෙන් ලැබෙන විශේෂ ප්‍රදාන ;
(ආ) පළාත් සභා විශේෂ ප්‍රදාන ;
(ඇ) යම් පුද්ගලයෙකු, ආයතනයක් හෝ සංවිධාන කරන පරිත්‍යාග ;
(ඈ) රාජ්‍ය නොවන සංවිධානවලින් දෙනු ලබන ප්‍රදානයන් ;
(ඉ) ලොතරැයි, සංදර්ශන හා වෙනත් සම්මත ක්‍රමවලින් උපයා ගනු ලබන ආදායම් ;
(ඊ) ඌව පළාතේ අක්‍රිය වී ඇති සමිති හා අක්‍රිය වන සමිති නැවත සක්‍රීය කිරීමට නොහැකි වන අවස්ථාවල දී ඈවර කිරීමෙන් ලැබෙන මුදල්.

මුදල් වර්ෂය.

15.1 සමිති බල මණ්ඩල ගිණුම් වර්ෂය වනුයේ ලිත් වර්ෂය වේ.

15.2 සමිති හා බල මණ්ඩල ගිණුම් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වැනි ඡේදයේ සඳහන් පරිදි විගණනයට ලක් කළ යුතුය.

අනුමත ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීම

16.1 අමාත්‍යාංශයෙන් අනුමත කරන ලද ව්‍යවස්ථා මාලාවන්ට අනුකූලව කටයුතු කිරීමට ග්‍රාම සංවර්ධන විෂයෙහි කටයුතු කරන සියලුම නිලධාරීන් බැඳී සිටී.

16.2 ලියාපදිංචි කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රාදේශීය බල මණ්ඩල හා දිස්ත්‍රික් බල මණ්ඩලවල හා පළාත් බල මණ්ඩලයේ යාවත්කාලීන ලේඛනයක් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යා යුතු ය.

16.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙනුවෙන් අදාළ සමිති ලේඛනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යා යුතු ය.

16.4 මෙම ප්‍රඥප්තියේ අරමුණු හා සම්මත කර ගන්නා ලද ව්‍යවස්ථාවකට පටහැනිව ක්‍රියාකරනු ලබන සමිති හා බල මණ්ඩල නිලධාරීන්ට විරුද්ධව නිසි පරීක්ෂණ පැවැත්වීමට විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාට බලය ඇත්තේය. එවන් පරීක්ෂණයක් අවසානයේ දී අවස්ථාවෝචිත පරිදි නිලධාරීන් නිලයෙන් පහකිරීම හා සමිති විසුරුවා හැරීම හා අදාළ පාර්ශවයන්ට විරුද්ධව නීති කටයුතු ආරම්භ කිරීම ද නීත්‍යානුකූල වන්නේ ය.

16.5 ඉහත 16.4 ඡේදය ප්‍රකාරව කටයුතු කිරීමත් අනතුරුව අදාළ සමිති ප්‍රතිසංවිධාන කිරීම, නැවත ලියාපදිංචි කිරීම හෝ අවලංගු කිරීම ආදි කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලය ඇත්තේ ය.

16.6 අවලංගු කරන ලද සමිතියක වත්කම් අමාත්‍යාංශ ලේකම්වරයා නම් කරන නිලධාරියෙකුට හෝ ආයතනයකට විධිමත්ව භාරදිය යුතු අතර එම කටයුතු නිසියාකාරව නිමවන තෙක් අදාළ වත්කම් වල වගකීම දේපළ භාරව සිටි අයගෙන් නොගත යුතුය.

අර්ථ නිරූපනය.

1. *අමාත්‍යවරයා* - ඌව පළාත් ග්‍රාම සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා ;
2. *ලේකම්වරයා* - අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;
3. *දේපළ* - ග්‍රාම සංවර්ධන ආයතනය සතු පොත්පත්, කාර්යාල උපකරණ, නීත්‍යානුකූල ලියවිලි, ගොඩනැගිලි, ඉඩකඩම් හා වෙනත් චංචල හා නිශ්චල දේපළ හා අත ඉතිරි හා බැංකු ශේෂ අදහස් කෙරේ.

වචනාර්ථය.

මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වචනාර්ථ අතර හෝ පාඨ අතර යම් අනනුකූල අවස්ථාවක් ඇති වුවහොත් සිංහල වචනාර්ථය හා පාඨාර්ථය බල පැවැත්විය යුතුය.

06-15/1

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 04 දරන ඌව පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් 2011 මාර්තු මස 24 වැනි දින සම්මත කරන ලදුව 2011 අප්‍රේල් මස 11 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
පළාත් සභා ලේකම්,
ඌව පළාතේ පළාත් සභාව.

2011 මැයි මස 02 වැනි දින,
බදුල්ල,
රජ වීදියේ පිහිටි,
ඌව පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාව**

***ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 04 දරන ඌව පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වැනි උපලේඛනයේ පළමුවැනි ලැයිස්තුවේ දක්වා ඇති ප්‍රමාණයට අධ්‍යාපනය හා අධ්‍යාපන සේවා සහ ඊට අනුෂාංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම සඳහා ද ඌව පළාත් සභාවේ 1990 අංක 04 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහාද විධිවිධාන සලසනු ලබන ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන වරින්වර සංශෝධිත 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය

(i) මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ වර්ෂ 2011 අංක 4 දරන "අධ්‍යාපන ප්‍රඥප්තිය" ලෙස හඳුන්වනු ලැබේ.
ඌව පළාත් ආණ්ඩුකාරවරයා අනුමත කරනු ලබන දින සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේ ය.

## *I වැනි කොටස*

### ඌව පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා එහි ධූරයන්

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ධූරයන් පිහිටුවීම.

2. රටේ ආර්ථික සහ සමාජීය අවශ්‍යතාවයන්ට සුදුසු නිර්මාණශීලී කුසලතා ඇති පුරවැසියන් බිහි කිරීම උදෙසා අවශ්‍ය අධ්‍යාපන සේවාවක් ඌව පළාත තුල ක්‍රියාත්මක කිරීම පිණිස (මෙහි මින් මතු දෙපාර්තමේන්තුව වශයෙන් හඳුන්වනු ලබන) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඌව පළාතේ පළාත් සභාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ යන ධූරයන් මෙයින් පිහිටුවනු ලබන්නේ ය.

3.(1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා 2 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ (මෙහි මින් මතු අධ්‍යක්ෂ වශයෙන් හඳුන්වනු ලබන) ඌව පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ යන නාමය හා අභිදානය යටතේ ධූරය දරන්නා ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය.

2. ඌව පළාතේ අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ (මෙහි මින්මතු අමාත්‍යවරයා යනුවෙන් හඳුන්වනු ලබන) සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන වලට යටත්ව ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම භාර තැනැත්තා වන්නේ ය.

3. මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා ඉහත 2 වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරය සඳහා සුදුසු අයෙකු ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු වන්නේ ය.

4. මෙම ප්‍රඥප්තියෙහි කාර්යයන් සඳහා ජාතික නිර්ණායකයන්ට අනුව ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අතිරේක පළාත් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ඇතුළු අවශ්‍ය වෙනත් නිලධාරීන් පත් කළ යුතු වන්නේ ය.

5. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුව පැවැති ඌව පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සියලු නිලයන්හි මෙම ප්‍රඥප්තිය සම්මත වූ දින සිට පිහිටුවනු ලැබුවනුයේ සැලකිය යුතු අතර, එකී දෙපාර්තමේන්තුවේ තනතුරු, නිලතල දරන සෑම නිලධාරියෙකුම සහ සේවකයෙකුම මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූවන් සේ සැලකිය යුතු වන්නේය.

බලතල පැවරීම.

7. මෙම ප්‍රඥප්තිය යටතේ නිලධරයන් පත්කිරීම සහ මාරු කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් හෝ එකී බලතල විටින් විට පවරනු ලැබූ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ වෙනත් බලධරයෙකු විසින් හෝ සිදුකළ යුතුය.

8 මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරී ඇති ඕනෑම බලතලයක් ඔහු විසින් අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු හෝ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු වෙත පවරනු ලැබිය හැකිය.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සතු කාර්යයන්.

9. (අ) මෙම ප්‍රඥප්තියෙහි උපලේඛන I හි ඇතුළත් වර්ගවලට අයත් සියලුම පාසල් (ජාතික පාසල් හැර) සඳහා පහසුකම් සැලසීම,

(ආ) එකී පාසල් අධීක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම,

(ඇ) වාර්ෂික අධ්‍යාපන සැලැස්ම පිළියෙල කොට එය ක්‍රියාත්මක කිරීම,

(ඈ) අධ්‍යාපන විද්‍යායතනවලින් හා විශ්ව විද්‍යාල වලින් දෙන ලද්දාවූද, ඉගැන්වීමේ සුදුසුකම් වශයෙන් පිළිගෙන ඇත්තාවූ ද, ඩිප්ලෝමා සහ උපාධි ඇති තැනැත්තන් ඌව පළාතේ පාසල්වල ගුරුවරුන් ලෙස බඳවා ගැනේ.

(ඉ) අධ්‍යාපන නිලධරයන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන්ගේ කාර්ය සාධන ඇගයීම ;

(ඊ) ජාතික අධ්‍යාපන ආයතනයේ සහ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පුහුණු වැඩසටහන් පැවැත්වීම ;

(උ) විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සංවිධාන කරනු ලබන ප්‍රාදේශීය විභාග පැවැත්වීම ;

(ඌ) නොවිධිමත් අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(එ) ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමැතිය මත ප්‍රාථමික පාසල් විෂය මාලාවේ සහ ද්විතීයික අධ්‍යාපන විෂය මාලාවේ තෝරාගත් විෂයයන්වල ප්‍රාදේශීයව වෙනස්කම් ඇති කිරීම ;

(ඒ) ඉගැන්වීම් ආධාරක, දෘෂ්‍යාධාර හා ශ්‍රව්‍යාධාර උපකරණ, පාසල් ලී බඩු සපයා බෙදාහැරීම ;

(ඔ) පාසල් ගොඩනැගිලි, පුස්තකාල, ක්‍රීඩා භූමි හා අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම් හා ඒවා නඩත්තු කොට පවත්වාගෙන යාම ;

(ඕ) පාසල් විද්‍යා උපකරණ සපයා බෙදා හැරීම ;

(ක) ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් කරනු ලබන මග පෙන්වීම අනුව පාසල් පුස්තකාල සංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම ;

(ඛ) පළාත තුල ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් ඇති කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම;

(ග) 1 ABC පාසල් හැර අනිකුත් සියලු පාසල් සඳහා විදුහල්පතිවරුන් පත්කිරීම. (ජාතික අධ්‍යාපන අමාත්‍යාංශයේ උපමානයන්ට අනුව) ;

(ඝ) පළාත තුල පෙර පාසල් පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම ;

(ඞ) ඌව පළාත තුල පිහිටි කුමන හෝ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයක සීමාවන් තීරණය කිරීම ;

(ය) පාසැල් සිසුන් සඳහා වෛද්‍ය පරීක්ෂණ හෝ ප්‍රතිකාර ලබාදීම සිසුන් හට සෞඛ්‍ය සහ නොමිලේ ආහාර ලබාදීම මෙන්ම නොමිලේ පෙළ පොත් ලබාදීම ඇතුළු ශිෂ්‍ය සුභසාධන කටයුතු. ;

(ර) පළාතේ වැඩිහිටි අධ්‍යාපනයට සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

පළාත් අධ්‍යාපන මණ්ඩලය පිහිටුවීම

9.1 (I) පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රවීනත්වයක් ලබා ඇති දහතුන් දෙනෙකුගෙන් සමන්විත මෙහි මින් මතු "උපදේශක මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන අධ්‍යාපන උපදේශක මණ්ඩලයක් පත් කළ යුතු වන්නේ ය.

උපදේශක මණ්ඩලය සංයුතිය

(II) (අ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්,

(ආ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා,

(ඇ) ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන එහි ආචාර්ය මණ්ඩලයේ නියෝජිතයෙක් ;

(ඈ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අධ්‍යාපන විශේෂඥ දැනුමැති හතර දෙනෙක්,

(ඉ) අධ්‍යාපන පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්,

(ඊ) අධ්‍යාපන පරිපාලන සේවයේ 1 වැනි පන්තියේ විශ්‍රාමලත් නිලධාරියෙක්,

( උ) විදුහල්පති සේවයේ I වැනි පන්තියේ ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික නිලධාරියෙක්,

(ඌ) ගුරු සේවයේ I පංතියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්,

(එ) අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති නියෝජනය සඳහා නියෝජිතයින් දෙදෙනෙක්.

සභාපති/ලේකම් පත්කිරීම

(III) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම මෙම කමිටුවේ සභාපති වන අතර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා එහි ලේකම් විය යුතු ය.

(IV) උපදේශක මණ්ඩලයට නම් කරනු ලබන නිලධාරීන් තම සේවා කාලයන් තුළදී කිසිදු චෝදනාවකට වරදකරුවන් නොවූ තැනැත්තන් විය යුතු ය.

(V) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හැර උපදේශක මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු සිය අභිමතය පරිදි හේතු දක්වා පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉවත් කිරීම කළ හැකි වන්නේ ය.

(VI) ඉල්ලා අස්වීම, මරණය හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතු කොට ගෙන කලින් තම ධුරය හිස් කළොත් මිස උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු එසේ පත් කරනු ලැබූ දින සිට වසර 03ක් සඳහා තම ධුරය දැරිය යුතු ය. අවශ්‍ය වන්නේ නම් ඔවුන් නැවතත් පත් කළ හැකි ය.

(VII) උපදේශක මණ්ඩලයේ සමාජිකයකු විසින් තත් කාර්යය සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් කවර වේලාවකදී වුව ද සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි වන්නේ ය. එසේ ඉල්ලා අස්වන සාමාජිකයා වෙනුවට පත් කරනු ලබන අනුප්‍රාප්තිකයාගේ ධුර කාලය පූර්ව ගාමියාගේ සාමාජික ධුරයේ ඉතිරි කාලය සඳහා පමණක් වන්නේ ය.

(VIII) උපදේශක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන නියෝග මගින් සැලසිය හැකිය. උපදේශක මණ්ඩලයේ රැස්වීම් සඳහා සහභාගි වීම වෙනුවෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සුදුසු පාරිශ්‍රමිකයක් ගෙවිය හැක්කේ ය.

උපදේශක මණ්ඩලයේ කාර්යයන්

10. (I) අධ්‍යාපනය හා අධ්‍යාපන පහසුකම් සපුරාලීමට අදාළ කරුණු සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් උපදෙස් සඳහා උපදේශක මණ්ඩල වෙත යොමු කරනු ලැබිය හැකි කරුණු සම්බන්ධයෙන් සහ උපදෙස් දිය යුතු යැයි මණ්ඩලයට හැඟී යන වෙනත් කරුණු සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා වෙත උපදෙස් දීම,

(II) අමාත්‍යවරයා විසින් ඉල්ලීමක් කළ විට ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිවලට සහ පරමාර්ථයන්ට අනුකූලව පළාත් අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා උපදෙස් ලබා දීම,

(III) අධ්‍යාපන ගොඩනැගිලි, ක්‍රීඩා භූමි, තාක්ෂණික ඒකක, නේවාසිකාගාර සහ ගුරු නිවාස ඇතුළු වෙනත් අධ්‍යාපන ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් මග පෙන්වීම හා උපදෙස් ලබා දීම,

(IV) ඉගැන්වීම් සහ ඉගෙනීමේ ක්‍රියාවලියට අවශ්‍ය අධ්‍යාපන උපකරණ සැපයීම හා පුස්තකාල පහසුකම්, ක්‍රීඩා ඇතුළු අනෙකුත් පහසුකම් සැලසීම සම්බන්ධයෙන් උපදෙස් දීම,

(V) අළුතින් ආරම්භ කළ යුතු පාසල් සම්බන්ධයෙන් කරුණු සාකච්ඡාවට භාජනය කොට අවශ්‍ය උපදෙස් දීම,

(VI) පාසල් සංවිධානය, වර්ගීකරණය, ඒවායේ ශ්‍රේණීන් උසස් කිරීම, පාසල් නම් කිරීම, වෙනස් කිරීම හා පාසල් වසා දැමීමට අදාළ වූ කරුණු පිළිබඳ උපදෙස් දීම,

(VII) පාසල්වල නව පංති ආරම්භ කිරීම, වෘත්තීය හා කාර්මික, තාක්ෂණික පාඨමාලා සඳහා මධ්‍යස්ථාන තීරණය කිරීම, නොවිධිමත් අධ්‍යාපනය පිළිබඳ කටයුතු, ඉංග්‍රීසි ඇතුළු විදේශීය භාෂා ඉගැන්වීම පුළුල් කිරීම පිළිබඳ උපදෙස් දීම,

(VIII) අවශ්‍ය අවස්ථාවල දී අධ්‍යාපන සංවර්ධන සැලැස්මට අදාළ නව යෝජනා ඉදිරිපත් කිරීම, සැලසුම් ප්‍රතිශෝධනය කිරීම සඳහා වූ උපදෙස් ලබාදීම,

(IX) අධ්‍යාපන සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා ලබන ප්‍රගතිය කලින් කලට සමාලෝචනය කිරීම,

(X) පළාත තුල අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සම්බන්ධයෙන්වූ යෝජනා ඉදිරිපත් කිරීම, අධ්‍යාපනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවයන් සහ බාධක මග හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව අමාත්‍යවරයා වෙත යෝජනා ඉදිරිපත් කිරීම.

11. පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළව කටයුතු කිරීමේ දී රජය විසින් කලින් කලට අනුමත කරනු ලබන ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. පොදු විධිවිධාන

(අ) අනිවාර්ය අධ්‍යාපනය සැලසීම ;

(ආ) පාසල් වලට පළමු ශ්‍රේණියට හා අනිකුත් ශ්‍රේණි වලට ළමුන් ඇතුලත් කිරීම ;

(ඇ) පහසුකම් හා සේවා ගාස්තු අය කිරීම ;

(ඈ) පාසල් සංවර්ධන සමිති පිහිටුවා පවත්වාගෙන යාම ;

(උ) පාසැල් විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම ;

(ඌ) ගුරුවරුන් සඳහා වූ ස්ථාන මාරු කිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පළාත් බලධාරින් කටයුතු කිරීම.

(එ) පාසල් වර්ගීකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියකට අනුව ඌව පළාත තුළ පාසැල් වර්ගීකරණය කිරීම ;

(ඒ) විෂය සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඉ) ජාතික නිර්නායකයන්ට අනුකූලව තනතුරුවලට නිලධාරීන් හා පාසල්වලට විදුහල්පතිවරුන් පත්කිරීම.

12. ඌව පළාත තුළ පවත්නා පාසල් ගොඩනැගිලි, පරිශ්‍රයන්, එහි උපකරණ, අනුමැතිය ලත් ක්‍රීඩා, සංස්කෘතික, ආගමික කාර්යයන් හැර වෙනත් කටයුත්තක් සඳහා යොදා නොගත යුතු ය. එසේම පාසල් සිසුන් අධ්‍යාපනයට නොවන කිසිදු උත්සවයකට හෝ කාර්යයකට යොදා නොගත යුතු ය. ජාතික වැදගත්කමකින් යුත් වෙනත් කාර්යයන් සඳහා යොදා ගන්නේ නම් ඒ සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වන්නේ ය. පාසැල් ගොඩනැගිලි පරිශ්‍රයන් උපකරණ හා පාසැල් සිසුන් වෙනත් කටයුතු සඳහා නොගත යුතු බව

13. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනයට පෙරාතුව වන දිනයක දී අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රජයට හෝ පළාත් සභාවට අයත් හෝ වෙනත් ප්‍රභවයකින් ලද කිසියම් වත්කමක් හෝ දේපළක් අධ්‍යාපන කාර්යයන් සඳහා යොදවා තිබුණි නම් ඒවා මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පැවරුණු වත්කමක් ලෙස සැලකිය යුතු ය. අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු වත්කම්

14. (I) සමාලෝචන වර්ෂය තුළ ඌව පළාතේ අධ්‍යාපනික කටයුතු පවත්වාගෙන ගිය ආකාරය, එහිලා පැන නැගුණු ගැටළු සහ එකී ගැටළු මගහරවාලීමට ගත් ක්‍රියාමාර්ගයන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි දක්නට ලැබෙන උපනතින් ගැනද ඇතුලත්ව වාර්ෂික පාලන වාර්තාවක් පිළියෙල කොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පළාත් අධ්‍යාපන ලේකම්වරයා මගින් අනුගාමී වර්ෂයේ ජුනි 30 වැනි දිනට පෙර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. වාර්ෂික පාලන වාර්තාව

(II) ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් එකී පාලන වාර්තාව පළාත් සභාවෙහි සභාගත කළ යුත්තේ ය.

නියෝග හෝ තීරණයන් සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට අමාත්‍යවරයා සතු බලතල

15. (I) මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ පනවනු ලබන රෙගුලාසි යටතේ තමන් වෙත පැවරෙන බලය/අභිමතය පාවිච්චි කරමින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කරන ලද යම් නියෝගයක් හෝ තීරණයක් වෙනත් සාධාරණ හේතූන් මත වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමේ බලය අධ්‍යාපන අමාත්‍යවරයා සතු වන්නේ ය.

(II) එවැනි අවස්ථාවල දී I වැනි උපඡේදය යටතේ අමාත්‍යවරයා විසින් දෙනු ලබන තීරණය නීත්‍යානුකූල සහ අවසන් තීරණයක් වන අතර එකී තීරණ බලපාන සියලු තැනැත්තන් ඉන් බැඳී සිටිය යුත්තේ ය.

රෙගුලාසි පැනවීම

16. (I) මෙම ප්‍රඥප්තිය යටතේ පැවරෙන බලය මත එක් කරුණක් හෝ සියලු කාරණයන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රෙගුලාසි පැනවිය හැක්කේ ය. විශේෂයෙන්ම –

(අ) පළාත් සභාවේ පාසැල්වල අධ්‍යාපන විභාග පැවැත්වීම ;

(ආ) පාසල් ගොඩනැගිලි හා පරිශ්‍රයන් ආරක්ෂා කිරීම ;

(ඇ) නව පාසල් ආරම්භ කිරීම ;

(ඈ) පාසල් ඇගයීම් ක්‍රම හඳුන්වා දීම.

(II) ඉහත (I) වැනි උපඡේදය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම රජයේ *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු වන අතර එසේ පළ කරනු ලැබූ දින හෝ රෙගුලාසියේ නිශ්චිතව සඳහන් යම් පසු දිනක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(III) ඉහත (I) උපඡේදය යටතේ සාදනු ලබන සෑම රෙගුලාසියක්ම රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසුව එය හැකිතාක් ඉක්මනින් ඌව පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පළාත් සභාව විසින් අනුමත නොකරනු ලබන සෑම රෙගුලාසියක්ම ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, එසේ අනුමත නොකළ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(IV) යම් රෙගුලාසියක් පරිච්ඡින්න කරනු ලැබුවා සේ සලකනු ලබන දිනය රජයේ *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු ය.

පාසැල් නිවාඩු දින ප්‍රකාශයට පත් කිරීම

17. හදිසි අත්‍යාවශ්‍ය අවස්ථාවක දී ඌව පළාත තුල පිහිටි පාසල් කිහිපයක් හෝ සියල්ලම හෝ පාසල් නිවාඩු දින බවට ප්‍රකාශයට පත් කිරීමේ බලය පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා සතු වන්නේ ය.

නිලධරයන් සහ සේවකයින් රාජ්‍ය සේවකයින් වන බව

18. ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සියලුම නිලධරයන් සහ සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යයන් සඳහා රාජ්‍ය සේවකයින් ලෙස සලකනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ විගණනය

19. (I) මෙම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා මුදල් වර්ෂය ලිත් වර්ෂය වන අතර පළාත් සභාවේ වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් ලබාදෙන මුදල් ප්‍රතිපාදනවලින් ද වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල්වලින් ද අවශ්‍ය විටෙක පරිපූරක ඇස්තමේන්තු මගින් ද ලැබෙන ප්‍රතිපාදනවලින් දෙපාර්තමේන්තුවේ පරිපාලන හා සංවර්ධන කටයුතු ඉටු කරනු ලැබිය යුතු ය.

(II) මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු විගණකාධිපති දෙපාර්තමේන්තුව හා ඌව පළාත් සභාවේ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මගින් විගණනයට භාජනය කළ යුතු අතර විගණනය සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වැනි වගන්තියට අනුකූල විය යුතු ය.

දෙපාර්තමේන්තුව අල්ලස් පනතේ අර්ථානුකූලව උප ලේඛනගත ආයතනයක් විය යුතු බව

20. ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධානයන්ට වෙන් විය යුතු ය.

21. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාතේ පළාත් සභාවේ "1990 අංක 04 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ."

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි – අර්ථ නිරූපනය

(1) "අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා අදහස් කෙරේ ;

(2) "ලේකම්වරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ අධ්‍යාපන විෂය භාර ලේකම් අදහස් කෙරේ ;

(3) "පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ දක්වා ඇති ඌව පළාත් බල ප්‍රදේශය අදහස් කෙරේ ;

(6) "පාසැල් ප්‍රධානියා" යන්නෙන් විදුහල්පති හෝ ඒ වෙනුවට වැඩබලන වෙනත් තැනැත්තෙකු අදහස් කෙරේ ;

(7) "ජාතික නිර්නායකයන්" යන්නෙන් දීපව්‍යාප්ත සේවාවට අයත් වන අධ්‍යාපන පරිපාලන සේවයේ පත්වීම් බලධරයා වන ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2003.12.02 දිනැති චක්‍රලේඛ අංක 04/03 හි උපදෙස්වලට අනුකූලව විය යුතුය යන්න අදහස් වේ ;

(8) " පළාත් රජ්‍ය සේවා කොමිෂන් සභාව" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වැනි කොටසෙහි 33 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂම අදහස් කෙරේ.

22. මෙම ප්‍රඥප්තියෙහි සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨයබල පැවැත්විය යුතු ය.

## උපලේඛනය I

### *පාසල් වර්ගීකරණය*

(1) 1 AB – අ.පො.ස (උ/පෙළ) දක්වා කලා, වාණිජ හා විද්‍යා විෂය මාලාවන්හි පංති පැවැත්වෙන පාසල්

(2) 1 C – 11 වසර දක්වා පංති පැවැත්වෙන පාසල් (අ.පො.ස (උ/පෙළ)) දක්වා කලා හා වාණිජ පංතිද පැවැත්විය හැකිය).

(3) 2 – 9 වසර දක්වා පංති පැවැත්වෙන පාසල්.

(4) 3 – 5 වසර දක්වා පංති පැවැත්වෙන පාසල්.

## උපලේඛනය II

### *පාසල් වර්ගීකරණයට අනුව පාසැල්වලට පත්කළ යුතු විදුහල්පති ශ්‍රේණිධාරීන්*

(1) 1 AB පාසල් සඳහා – අධ්‍යාපන පරිපාලන සේවයේ II හෝ III හෝ විදුහල්පති සේවයේ I පංතියේ නිලධාරීන්

(2) 1 C පාසල් සඳහා – විදුහල්පති සේවයේ I පංතියේ හෝ II පංතියේ නිලධාරීන්.

(3) 2 ශ්‍රේණියේ පාසල් සඳහා – විදුහල්පති සේවයේ II පංතියේ හෝ II/I පංතියේ නිලධාරීන්.

(4) 3 ශ්‍රේණියේ පාසල් සඳහා – විදුහල්පති සේවයේ II/I හෝ III ශ්‍රේණියේ නිලධාරීන්.

**ඌව පළාතේ, පළාත් සභාව**

2011 අංක 05 දරන ඌව පළාතේ, පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් 2011 මාර්තු මස 24 වැනි දින සම්මත කරන ලදුව 2011 අප්‍රේල් මස 11 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
පළාත් සභා ලේකම්,
ඌව පළාත් සභාව.

2011 මැයි මස 02 වැනි දින,
බදුල්ල, රජ වීදියේ පිහිටි
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාත් සභාවේ 2011 අංක 5 දරන පෙර පාසල් ප්‍රඥප්තිය**

13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ඌව පළාත් සභාවට පැවරී ඇති විෂයන්ට අදාළ කාර්යයන් හා කර්තව්‍යන් ඉටු කිරීම සඳහාද, ඌව පළාත තුළ දැනට පවත්වාගෙන යනු ලබන පෙර පාසල් ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය කිරීම හා මෙහෙයවීම සඳහා ද, ඊට අනුශාංගික කාරණා සඳහා ද වූ විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ ප්‍රඥප්තියකි.

පැනවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව විසින් පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය 2011 අංක 5 දරන ඌව පළාතේ පෙර පාසල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන දිනක සිට ක්‍රියාත්මක වේ.

## *I* කොටස
## අරමුණු

අරමුණ

02. දරුවෙකුගේ පෙර පාසල් අවධිය වශයෙන් සැළකෙන අවුරුදු 3 සිට අවුරුදු 05 සම්පූර්ණ වන තෙක් කාලසීමාව තුළ ළමාවිය සංවර්ධනය සඳහාත් නිසිමග පෙන්වීම සඳහාත් වූ පහත සඳහන් පරමාර්ථයන් ඉටු කිරීම මෙම ප්‍රඥප්තියේ අරමුණු වේ.

(01) ඉන්ද්‍රියන් ඇසුරින් අත්දැකීම් ලබා ගැනීමට හැකි හිතකර සාරවත් ආරක්ෂා සහිත පරිසරයක් ඇති කිරීම ;
(02) එදිනෙදා ක්‍රියාකාරකම් තුළින් යහපත් ආචාරශීලී හැසිරීම් රටාවක් සංවිධානය කර ගැනීමට සහ ප්‍රියමනාප කතා බහකට හුරුවීමට අවස්ථාව ලබාදීම ;
(03) මනා සෞඛ්‍ය පුරුදු හුරු කිරීම හා දරුවන්ට නිසි පෝෂණය ලබාදීම ;
(04) යහගුණ වගා කර ගැනීමට හිතකර පරිසරයක් සැපයීම ;
(05) අවුරුදු 03-05 දක්වා ළමුන්ට නිසි අධ්‍යාපනය හා නිසි රැකවරණය ලබාදීම ;
(06) ළමා රැකවරණය හා අයිතීන් සුරැකීම හා නීතිය ක්‍රියාත්මක කිරීම ;
(07) දරුවන්ගේ මානසික හා පෞරුෂත්වය වර්ධනය කිරීම ;
(08) ශාරීරික වර්ධනය හා හසුරු කුසලතා සංවර්ධනයට අවස්ථා සැලසීම ;
(09) බුද්ධිමත් නිර්මාණශීලි හැකියා සංවර්ධනය කිරීම ;
(10) පරිසරයට ආදරය කිරීම හා ඒ තුළින් වින්දනයක් ලබා ගැනීමට, පරිසරය අගය කිරීමට හා පරිසරය ආරක්ෂා කිරීමට මග පෙන්වීම ;
(11) අභියෝගාත්මක අවස්ථාවන්ට මුහුණු දීමේ හැකියාව ලබාදීම ;
(12) සහජීවනයෙන් කටයුතු කිරීමට හුරු කෙරෙන සුහද වාතාවරණයක් ගොඩනැගීම ;
(13) දරුවාට මුල් ළමාවිය සතුටින් හා විනෝදයෙන් ගත කිරීමට ඉඩ සැලැස්වීම ;
(14) මෙම වයසේ ළමුන්ගේ හැකියාවන් අවදි කිරීම හා පෝෂණය කිරීම සඳහා සුදුසු පරිසරයක් ඇති කිරීම ;
(15) ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපනය උදෙසා ශක්තිමත් අත්තිවාරමක් ලබාදීම.

## *II* කොටස
## පරිපාලනය හා අධීක්ෂණය කිරීම

03. ආණ්ඩුකාරතුමා විසින් නමින් හෝ නිළ නාමයෙන් (මෙහි මින්මතු නිසි බලධරයා යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තෙකු මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලධරයා ලෙස පත්කළ යුතු ය. නිසි බලධරයෙකු පත්කිරීම.

04.ආණ්ඩුකාරවරයාගේ විධානයට හා පාලනයට යටත්ව නිසි බලධරයා විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ඉටු කළ යුත්තේ ය. කාර්ය හා කර්තව්‍යය

(අ) පළාත් තුළ පැවැත්වෙන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට ඇතුළුවීම, පරිශ්‍රය හා අදාළ ලිපිලේඛන පරීක්ෂා කිරීම ;

(ආ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හිමිකරුවන්ගෙන් හෝ ඒවා පවත්වනු ලබන අයගෙන් හෝ ඒ අවස්ථාවේ එහි සිටින පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පරිපාලන කටයුතුවලට සම්බන්ධ වූ ඕනෑම අයෙකුගෙන් ප්‍රශ්න කිරීම හා පැහැදිලි කිරීම් ලබාගැනීම ;

(ඇ) යම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම හෝ හේතු දක්වා ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම ;

(ඈ) යම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ඉගැන්වීමේ කටයුතු කරන හෝ යෙදී සිටින භාරකරු/අයිතිකරුගේ හා ගුරුවරුන්ගේ සුදුසුකම් සනාථ කිරීමට ඉල්ලා සිටීම හා එවැනි අවස්ථාවකදී එම සහතික ලබාගැනීම, පරීක්ෂා කිරීම සහ ඒවායේ සත්‍ය පිටපත් ලබාගැනීම ;

(ඉ) ඕනෑම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකට අයත් ලේඛන, පොත්පත්, සටහන් වාර්තා හා ගොනු පරීක්ෂා කිරීම හා අවශ්‍ය වුවහොත් තමා භාරයට ගැනීම ;

(ඊ) අවශ්‍ය සුදුසුකම් සනාථ කිරීමට අසමත් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක ඉගැන්වීමේ යෙදෙන්නන්ගේ සේවය අත්හිටුවීමට හා නතර කිරීමට පියවර ගැනීම ;

(උ) යම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක ඉගෙන ගන්නා දරුවන්ට මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති අවම පහසුකම් ලබාදෙන ලෙස ඒ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ආයතනයට හෝ හිමිකරුට නියම කිරීම ;

(ඌ) පවත්වනු ලබන ඕනෑම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් පරීක්ෂණයකින් පසුව එම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය මෙම ප්‍රඥප්තියෙන් සඳහන් විධිවිධානයන්ට අනුව පවත්වාගෙන නොයන්නේ නම් එම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම නතර කිරීම හෝ අත්හිටුවීම ;

(එ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන සේවා පහසුකම් හා කාර්ය මණ්ඩල ආදිය සැලකිල්ලට ගෙන ශ්‍රේණිගත කිරීම ;

(ඒ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල උගන්වනු ලබන ගුරුවර, ගුරුවරියන්ට, කාර්ය මණ්ඩලයට පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම හා එයට සහභාගිවීමට පෙර පාසල්වල උගන්වන ගුරුවරු, ගුරුවරියන්ට හා වෙනත් සම්බන්ධ අයවළුන්ට නියම කිරීම ;

(ඔ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන කලින් කලට අධීක්ෂණයට හා පරීක්ෂණයට ලක් කිරීම.

(ඕ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක පවත්වාගෙන යා යුතු පොත්පත්, ලේඛන හා ආකෘති පත්‍ර හඳුන්වාදීම හා ඒවා භාවිතා කිරීමට නියම කිරීම.

05. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් යටතේ තමා වෙත පවරා දෙනු ලබන යම් බලතල කාර්ය හා කර්තව්‍ය බලධරයා විසින් ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය යුතු ය.

06. මේ ප්‍රඥප්තිය යටතේ තමා වෙත පවරා දෙන ලද හෝ වෙන් කොට දෙන ලද බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් බලධරයා විසින් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව වෙනත් යම් පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධාරියෙකුට පවරා දෙනු ලැබිය හැකි ය. නිසි බලධරයා විසින් බලය පැවරිය හැකි බව

### *III* කොටස

### පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ උපදේශක කමිටු පත්කිරීම

පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන උපදේශක කමිටු

07. (1) පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත මෙහි මින් මතු උපදේශක කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන උපදේශක කමිටුවක් විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු ය.

*(අ)* පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන උපදේශක කමිටුව මෙහි මින් මතු නිළ බලයෙන් පත්කරනු ලබන සාමාජිකයින් ලෙස හඳුන්වනු ලබන;

1. පළාත් අධ්‍යාපන ලේකම්,
2. පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ හෝ නියෝජිතයෙක්,
3. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක,
4. පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්,
5. පළාත් පාලන කොමසාරිස්,
6. පළාත් සමාජ සේවා අධ්‍යක්‍ෂ,
7. ගරු උෟව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන, විෂය පිළිබඳ මනා පරිචයක් ඇති නියෝජිතයෙක්.

යන තැනැත්තන් සහ ;

*(ආ)* මෙහි මින් මතු පත්කරනු ලබන නියෝජිතයින් ලෙස හඳුන්වනු ලබන, ආණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලබන ;

1. ජාතික ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්‍ෂ හෝ නියෝජිතයෙකු,
2. පළාත් පාලන කොමසාරිස්වරයා විසින් නම් කරන ලද පෙර පාසල් ගුරුවරියක්,
3. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දිස්ත්‍රික් දෙක නියෝජනය වන ආකාරයෙන් තෝරාදෙනු, ලබන, පූර්ව ළමාවිය සංවර්ධන විෂයට අදාළව කටයුතු කරන ස්වේච්ඡා සංවිධානවලට අයත් නියෝජිතයින් එක් සංවිධානයකින් එක් අයෙකු බැගින්.

වශයෙන් පත්කරන සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුතු ය.

නිසි බලධරයා විසින් බලය පැවරිය හැකි බව.

08. (1) නිල බලයෙන් පත්වන අය අතුරින් උපදේශක කමිටුවේ සභාපති පළාත් අධ්‍යාපන ලේකම් විය යුතු අතර, ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන නිසි බලධරයා මෙම කමිටුවේ ලේකම් විය යුතු ය.

(2) නිල කාලය අවුරුදු තුනකට සීමා විය යුතු ය.

(3) උපදේශක කමිටුවේ රැස්වීමේ ගණ පූර්ණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(4) පත්කළ සාමාජිකයෙකු මියයෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය අත්හලොත් මිස වසර තුනක කාලයක් ධූරය දැරිය යුතු ය.

(5) පත්කල සාමාජිකයෙකු පිළිගතහැකි හේතුවක් ලෙස උපදේශක කමිටුව විසින් සලකන යම් හේතුවක් නොමැතිව, නොදන්වා සභාවේ රැස්වීම් තුනකට පිට පිටම නොපැමිණියහොත් එම සාමාජිකයා ධූරය අතහැර ගිය අයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය ;

(6) ආණ්ඩුකාරවරයා විසින් ඕනෑම අවස්ථාවක උපදේශක කමිටුවේ පත්කළ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය,

(7) පත්කළ සාමාජිකයෙකු විසින් තමා ධූරයෙන් ඉල්ලා අස්වන බවට ආණ්ඩුකාරවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය,

(8) පත්කළ සාමාජිකයෙකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධූරය හිස්වන අවස්ථාවක ආණ්ඩුකාරවරයා විසින් 7 (1) (අ) ඡේදයේ විධිවිධාන

සැළකිල්ලට ගෙන ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයෙකු වශයෙන් වෙනත් තැනැත්තෙකු පත්කළ යුතුය. එම සාමාජිකයා වෙනුවට පත්කරනු ලැබූ යම් අනුප්‍රාප්තිකයෙකු විසින් තම පූර්වගාමයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

09. (1) ප්‍රඥප්තියේ වෙනත් විධි විධානයන්ට යටත්ව රෙගුලාසි මගින් පත්කිරීම, රැස්වීම් හා වෙනත් අදාළ කරුණු සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටි උපදේශක කමිටුව විසින් සකස් කරගත යුතු ය.

*උපදේශක කමිටුව කාර්ය පටිපාටිය සකස් කළ යුතු බව.*

(2) උපදේශක කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් වත් රැස්විය යුතු ය.

10. යම් තැනැත්තෙක් ...............

*උපදේශක කමිටුව. පත්වීමට නුසුදුසුකම්.*

*(අ)* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම් හෝ පුරවැසියෙකු වී සිටීම නතර වුවහොත් ;

හෝ

*(ආ)* ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් වී හෝ බංකොලොත්භාවයට පත්වී සිටින බවට ප්‍රකාශයට පත්කරනු ලැබ සිටීනම් ;

හෝ

*(ඇ)* ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිනම් හෝ විඳ ඇත්නම් ;

හෝ

*(ඈ)* උපදේශක සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඔහු විසින් ඔහුගේ කාර්යයන් ඉටු කිරීමේදී හානිකර ලෙස බලපෑමට ඉඩ තිබෙන යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් දරයි නම් ;

හෝ

*(ඉ)* මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබුවහොත් හෝ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට හෝ කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙකු විය යුතු ය.

11. උපදේශක කමිටුවේ පුරප්පාඩුවක් හෝ සාමාජිකයෙකු පත්කිරීමේ අඩු පාඩුවක් හේතු කොටගෙන එමගින් ගනු ලබන තීරණයක් හෝ ගනු ලබන ක්‍රියාවක් අවලංගු නොවිය යුතු ය.

12. උපදේශක කමිටුව විසින් පහත දැක්වෙන කාර්ය හා කර්තව්‍ය ඉටුකළ යුතු ය.

*උපදේශක කමිටුවේ කාර්ය හා කර්තව්‍ය*

*(අ)* පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට අදාළ වන නියෝග සකස් කිරීම හා එම නියෝග ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කිරීම ;

*(ආ)* පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන කටයුතුවලට අදාළ සියළු අංශයන්ගෙන් ඉටුවිය යුතු කාර්යභාරය හඳුනාගැනීම සහ ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් සකස් කිරීම, උපදෙස් දීම, පසුවිපරම් කිරීම, අධීක්ෂණය කිරීම හා ඊට අදාළ උපදෙස් වරින් වර නිකුත් කිරීම ;

*(ඇ)* පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි ලියාපදිංචි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල විෂයට අදාළ විෂය නිර්දේශයන් නියම කිරීම, සංශෝධනය කිරීම හා ඊට අදාළ වෙනත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ;

*(ඈ)* විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමුන් හඳුනාගෙන ඔවුන්ට ගැලපෙනසේ ඉදිරි අධ්‍යාපන වැඩ සටහන් සකස් කිරීම හා එම ළමුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමටත් දරුවන්ගේ වර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සකස් කිරීමටත් පියවර ගැනීම.

(ඉ) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියාකාරකම් සිදුකරන හා පවත්වාගෙන යන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග නිශ්චය කිරීම ;

(ඊ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ලැබෙන අභියාචනා පිළිබඳ සොයා බලා ගරු ආණ්ඩුකාරතුමාට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(උ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිසි බලධාරියා වෙත උපදෙස් නිකුත් කිරීම.

13. ඌව පළාතේ සියළුම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා භාවිතා කළ යුතු විෂය මාලාවක් ජාතික අධ්‍යාපන ආයතනයේ මග පෙන්වීමට අනුකූලව උපදේශක කමිටුව විසින් සකස් කළ යුතු අතර එකී විෂය මාලාව ආණ්ඩුකාරවරයා විසින් පිළිගැනීමෙන් අනතුරුව පළාතේ සියළුම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ක්‍රියාත්මක කළ යුතුය.

## IV කොටස

### පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල තිබිය යුතු මූලික හා අවම පහසුකම්

*පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතීන්*

14. (1) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පහත සඳහන් මූලික හා අවම පහසුකම්වලින් සමන්විත විය යුතුය.

(අ) එක් දරුවෙකු සඳහා අවම වශයෙන් වර්ග අඩි 10ක ගොඩනැගිලි ඉඩකඩ වෙන්කර තිබීම.

(ආ) ළමුන් 25 කට එක් වැසිකිලියක් බැගින් වැසිකිලි පද්ධතියක් සකස් කර තිබීම.

(ඇ) ගොඩනැගිල්ලේ කාමර වර්ග ප්‍රමාණයෙන් 1/7 වන පරිදි වාතාශ්‍රය සැපයෙන ආකාරයට දොර ජනෙල් වලින් සමන්විත වී තිබීම.

(ඈ) ආරක්ෂිත තාප්පයක් හෝ ආරක්ෂිත වැටකින් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන භූමිය මැනවින් ආරක්ෂා කර තිබීම.

(ඉ) උපදේශක කමිටුවේ උපදෙස් පරිදි ප්‍රථමාධාර පෙට්ටියක් පවත්වාගෙන යාම

(ඊ) සෑම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකටම ක්‍රීඩා කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගෙමිදුලක් තිබීම.

(උ) සෑම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකම සාමාන්‍ය ශිෂ්‍යයන් සඳහා 20:1 අනුපාතයට ද විශේෂිත ළමුන් සඳහා 5:1 අනුපාතයට ද ගුරුවර ගුරුවරියන් යොදා ගැනීම.

(ඌ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකදීම භූමිය හෝ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකම ගෙවත්ත ප්‍රසන්න පරිසරයකින් සකස් කර තිබීම හා කමිටුව විසින් නියම කරනු ලබන ආකාරයට මූලික ක්‍රීඩා පහසුකම්වලින් සමන්විත වී තිබීම ;

(එ) ප්‍රමාණවත් පරිදි ලී බඩු උපකරණ තිබීම හා ඒවා දරුවන්ගේ මානසික ප්‍රබෝධයට ඉවහල්වන ආකාරයට ප්‍රසන්න පෙනුමකින් පවත්වාගෙන යාම ;

(ඒ) ආගමික වතාවත් කිරීමට සුදුසු ස්ථානයක් සකස් කර තිබීම.

(2) හානිකර හෝ අන්තරාදායක පරිසරයක් තුළ හෝ හානිකර හෝ අන්තරාදායක පරිසරයක් ඇති ස්ථානයක සිට මීටර් 100ක් ඇතුළත ප්‍රදේශය තුළ හෝ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය නොකිරීම.

**දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතීන්**

14. (1) දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහත සඳහන් මූලික හා අවම පහසුකම් වලින් සමන්විත විය යුතුය : දිවාසුරැකුම් මධ්‍යස්ථාවල තිබිය යුතු මූලික හා අවම පහසුකම්

(අ) එක් දරුවකු සඳහා අවම වශයෙන් වර්ග අඩි 10ක ගොඩනැගිලි ඉඩකඩ වෙන්කර තිබීම.

(ආ) ළමුන් 25කට එක් වැසිකිලියක් බැගින් වැසිකිලි පද්ධතියක් සකස් කර තිබීම,

(ඇ) ගොඩනැගිල්ලේ කාමර වර්ග ප්‍රමාණයෙන් 1/7 වන පරිදි වාතාශ්‍රය සැපයෙන ආකාරයට දොර ජනෙල් වලින් සමන්විත වී තිබීම,

(ඈ) ආරක්ෂිත තාප්පයක් හෝ ආරක්ෂිත වැටකින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන භූමිය මැනවින් ආරක්ෂා කර තිබීම,

(ඉ) උපදේශක කමිටුවේ උපදෙස් පරිදි ප්‍රථමාධාර පෙට්ටියක් පවත්වාගෙන යාම,

(ඊ) සෑම දිවා සුරැකුම් මධ්‍යස්ථානයකටම ක්‍රීඩා කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගෙමිදුලක් තිබීම,

(උ) සෑම දිවා සුරැකුම් මධ්‍යස්ථානයකම සාමාන්‍ය ශිෂ්‍යයන් සඳහා 20:1 අනුපාතයට ද, විශේෂිත ළමුන් සඳහා 5:1 අනුපාතයට ද පාලක පාලිකාවන් යොදා ගැනීම.

(ඌ) සෑම දිවා සුරැකුම් මධ්‍යස්ථානයකම භූමිය හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයකම ගෙවත්ත ප්‍රසන්න පරිසරයකින් සකස් කර තිබීම හා කමිටුව කරනු ලබන ආකාරයට මූලික ක්‍රීඩා පහසුකම් වලින් සමන්විත වී තිබීම,

(එ) ප්‍රමාණවත් පරිදි ලී බඩු උපකරණ තිබීම සහ ඒවා දරුවන්ගේ මානසික ප්‍රබෝධයට ඉවහල්වන ආකාරයට ප්‍රසන්න පෙනුමකින් පවත්වාගෙන යාම,

(ඒ) ආගමික වතාවත් කිරීමට සුදුසු ස්ථානයක් සකස්කර තිබීම.

(2) හානිකර හෝ අන්තරාදායක පරිසරයක් තුළ හෝ හානිකර හෝ අන්තරාදායක පරිසරයක් ඇති ස්ථානයක සිට මීටර් 100ක් ඇතුළත ප්‍රදේශය තුළ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය නොකිරීම.

15. මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස සෑම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් විසින්ම අනුගමනය කළ යුතු ප්‍රමිතීන් කවරේ ද යන්න ආණ්ඩුකාරවරයා විසින් නියෝග මගින් වරින්වර නියම කළ යුතුය. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා සුදුසුකම් හා ප්‍රමිතීන් ආණ්ඩුකාරවරයා විසින් නියම කළ හැකි බව.

*5 කොටස*

**පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම**

16. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පසු පළාතේ නිසි බලධාරියාගේ අනුමැතිය නොමැතිව පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම හෝ පිහිටුවීම නොකළ යුත්තේය.

17. මෙම ප්‍රඥප්තිය ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ මාස තුනක් ඉකුත්වීමට පෙර ඒ වන විට පළාත තුළ පවත්වාගෙන යනු ලබන සෑම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයකම අයිතිකරු හෝ කළමනාකරු එකී පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලේඛනගත කරන ලෙස මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතිය අනුව නිසි බලධරයා වෙත ඉල්ලුම් කළ යුතුය. ලියාපදිංචි නොකරන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යා නොහැකි බව

පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළයුතු බව.

18. මෙම ප්‍රඥප්තිය ගැසට් කිරීම මගින් ප්‍රකාශයට පත්කළ පසු කිසිවකු විසින් එසේ මාස තුනක් ඇතුළත ඉල්ලුම්කිරීමට අපොහොසත් වූ කිසියම් අයිතිකරුවෙකු හෝ කළමනාකරුවෙකු යුක්ති සහගත හා සාධාරණ යැයි බැලූ බැල්මට පෙනෙන හේතු සහිතව ඉල්ලීමක් කරනු ලැබුවිට ඉකුත් වූ කාලය සැළකිල්ලට ගෙන නිසිබලධරයා විසින් කිසියම් අමතර ගාස්තුවක් අයකර ලේඛනගත කළ හැකිය.

නියමිත කාලය තුළ ලියාපදිංචි නොකරන ලද පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලින් අමතර ලියාපදිංචි ගාස්තුවක් අයකළ යුතු බව.

19. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් අළුතින් ඇරඹීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පතෙහි (උපලේඛන අංක 01 සඳහන් කරුණු ඇතුළත් කළ යුතුය.) නිසි කරුණු ඉදිරිපත් කළ යුතු බව.

20. 1. ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම්කරු නිසි බලධාරියා විසින් නියම කරනු ලබන ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය.

2. ලියාපදිංචි කිරීමට හා බලපත්‍ර ලබාගැනීමේ කාලය, අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතා, අදාළ ආකෘති හා ගාස්තු නිසි බලධාරියා විසින් කලින් කලට ප්‍රකාශයට පත් කළ යුතුය.

3. ලියාපදිංචිවීමේ හා බලපත්‍ර ලබාගැනීමේ කාලය දීර්ඝ කිරීම සඳහා ද ප්‍රමාද වන කාලය සඳහා දඩ හා අමතර ගාස්තු අයකිරීම සඳහා ද නිසි බලධාරියාට බලය ඇත්තේය.

21. පළාත තුළ වයස අවුරුදු 03 ආරම්භයේ සිට අවුරුදු 05 දක්වා වූ ළමුන් සඳහා කිනම් ආකාරයක අධ්‍යාපන කටයුත්තක් ඉටුකිරීමේ අරමුණු ඇතිව, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින වන විට පවත්වාගෙන යන සෑම ආයතනයක් ම ද පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ලෙස සැලකේ.

සමාජසේවා දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන විශේෂිත ළමුන් සඳහා වන අවුරුදු 3-5 වයස් කාණ්ඩ වල ළමුන්ගේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද, පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ද මේ යටතේ ලියාපදිංචි විය යුතුය.

22. මෙම ප්‍රඥප්තියේ ඉහත සඳහන් විධිවිධාන කඩ කරමින් යම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කරන හෝ යම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, එම වරද කරන සෑම මාසයකටම රුපියල් 500 කට නොවැඩි දඩයකට යටත් වන්නේය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට නිසි බලධාරියාට බලය ඇති බව.

23. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට (21) වගන්තියෙහි සඳහන් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් නමින් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් නොවන නමකින් පවත්වාගෙන යනු ලබන කිසියම් අධ්‍යාපන ආයතනයක් ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි නිසි බලධාරියා වෙත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූවිට, එම ඉල්ලීම මෙම, ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල නොවේ නම් නිසි බලධාරියා විසින් ඒ පිළිබඳව හේතු දක්වා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය.

(1) එවැනි ප්‍රතික්ෂේප කිරීමක් කරනු ලැබූ සෑම අවස්ථාවකම එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත ඉල්ලීම කරනු ලැබූ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ අයිතිකරුට හෝ කළමනාකරුට දන්වා යැවිය යුතුය.

(2) එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදු වූ අවස්ථාවක එකී පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ අයිතිකරු හෝ කළමනාකරු විසින් ඒ සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා වෙත දින 10ක් ඇතුළත අභියාචනයක් කළ හැකිය.

(3) එවැනි අභියාචනයක් ලැබූ විට ආණ්ඩුකාරවරයා විසින් උපදේශක කමිටුව වෙත එය යොමුකොට උපදේශක කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ ලබාගනිමින් එකී අභියාචනය සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුය.

(4) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා ගනු ලබන තීරණය අවසාන තීරණය වන්නේය.

පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු බව.

24. (1) නිසිබලධරයා විසින් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වශයෙන් පවත්වාගෙන ගොස් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුව ලියාපදිංචි කරන ලද්දා වූ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව අළුතින් පිහිටුවා ලියාපදිංචි කරන ලද්දාවූ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමේ ලේඛනයක් එකී පෙර පාසල්වල නම් හා ලිපිනයන් ද, එම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යන තැනැත්තන්ගේ නම් හා ලිපිනයන් ද තවත් අවශ්‍ය යැයි නිසි බලධරයා විසින් තීරණය කරනු ලබන තොරතුරු ද සහිතව පවත්වාගෙන යා යුතුය.

(2) පළාතේ සෑම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ම නිසි බලධරයා විසින් ලියාපදිංචි කළ යුතු අතර, ඒ සඳහා අංකයක් හා ලියාපදිංචි සහතිකයක් ලබාදිය යුතුය.

(3) එකී සහතිකය මේ පනතේ කාර්යයන් සඳහා වලංගු නිත්‍යානුකූල ලියවිල්ලක් ලෙස සැලකිය යුතුය.

*6 කොටස*

**පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවර ගුරුවරියන් සඳහා සුදුසුකම් හා ඔවුන් පුහුණු කිරීම**

පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවර ගුරුවරියන් විසින් සපුරාලිය යුතු අධ්‍යාපන අවශ්‍යතා.

25. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවර ගුරුවරියන් වශයෙන් කටයුතු කරන තැනැත්තන් අවම වශයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් 06කින්වත් සමත්වීම හෝ උපදේශක කමිටුව විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් පවත්වන ලද පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.

(2) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ආරම්භ වන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල සේවයේ නියුතු ගුරුවර ගුරුවරියන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් සමත්වී තිබිය යුතුය.

සුදුසුකම් නොමැති අය නියමිත කාල සීමාව තුළ සුදුසුකම් ලැබිය යුතු බව.

26. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පවත්වාගෙන යන ලද පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල සේවයේ නියුතු ගුරුවර ගුරුවරියන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති නම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වසර දෙකක් ඇතුළත එකී විභාග සමත්වීම හෝ නිසි බලධරයා විසින් නියම කරනු ලබන පිළිගත් ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපන පාඨමාලාවක් ද හදාරා සමත්විය යුතුය.

සුදුසුකම් නැති අය ඉවත් කිරීමේ නියෝග නිකුත් කළ හැකි බව.

27. ඉහත සඳහන් පරිදි මූලික අධ්‍යාපන සුදුසුකම් වලින් තොර වූ ද නිසිබලධාරියා විසින් නියම කරනු ලබන කාලය තුළ මූලික අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීමට අපොහොසත් වන්නා වූ ද පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවර ගුරුවරියන් වශයෙන් කටයුතු කරන අයවලුන්ට එකී කටයුතු වලින් ඉවත්වන ලෙස නියෝග කිරීමට නිසි බලධරයාට බලය ඇත්තේය.

පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවර ගුරුවරියන් ලියාපදිංචි විය යුතු බව.

28. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට කිසියම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක අධ්‍යාපන කටයුතුවල නිරතවී සිටින සියළුම පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවර ගුරුවරියන් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හයක් ඇතුළත නිසිබලධාරියා වෙත ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම්කළ යුතුය.

(2) එසේ ඉල්ලුම්කරනු ලබන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවර ගුරුවරියන් ප්‍රඥප්තියේ විධිවිධාන අනුව සුදුසුකම් සපුරා ඇත්නම් නිසි බලධාරියා විසින් ඒ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ලේඛනයක ලියාපදිංචි කළ යුතු අතර, ඒ සමගම හැඳුනුම් පත්‍රයක් නිකුත් කළ යුතුය.

පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපන පුහුණු ආයතන ලියාපදිංචි කළ යුතු බව.

29. පළාතේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාවල ගුරුවර ගුරුවරියන් පුහුණු කිරීමේ කටයුතු වල යෙදෙන සෑම පුහුණුවීමේ ආයතනයක් ම (ජාතික මට්ටමේ රාජ්‍ය ආයතන හැර) නිසි බලධරයා වෙත ලියාපදිංචි විය යුතු අතර, ඒ සඳහා නිසි බලධරයා විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකයක් ලබා ගත යුතුය.

සෑම වසරකම විධිමත් පුහුණු වැඩ මුළුවක් සකස් කළ යුතු බව.

30. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවර ගුරුවරියන් පුහුණුවට අදාළව විධිමත් වැඩ පිළිවෙලක් නිසි බලධාරියා විසින් සෑම වසරකම සකස් කර අනුමැතිය සඳහා පළාත් උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

වෘත්තියෙන් ඉවත් වීමට නියෝග කළ හැකි බව.

31. පළාත් උපදේශක කමිටුව විසින් මෙහෙයවනු ලබන පුහුණු වීම්වලට සහභාගී නොවන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවර ගුරුවරියන්ට පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල සේවයේ යෙදීමෙන් වලකින ලෙස නියෝග කිරීමට නිසි බලධාරියාට බලය ඇත.

32. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවර, ගුරුවරියන් උපදේශක කමිටුව විසින් නියම කරන ලද කාල වකවානුවට අනුව නියමිත පුහුණු පාඨමාලාව අඛණ්ඩව හැදෑරිය යුතුය.

33. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම සඳහා උපදේශක කමිටුවේ ද උපදෙස් පරිදි විධිමත් සැලැස්මක් නිසි බලධාරියා විසින් සකස් කර, ක්‍රියාත්මක කළ යුතුය.

### *7 කොටස*

### පොදු විධිවිධාන

ආණ්ඩුකාරවරයා විසින් නියෝග සෑදිය හැකිය.

34. (1) නියම කළ යුතු යැයි මේ ප්‍රඥප්තිය මගින් නියමිත හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය මගින් බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියලු කාරණා සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනුමත දිනයේ සිට එකී නියෝග යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදන *ගැසට් පත්‍රයේ* පළකළ යුතුය.

නිසි බලධාරියාට රීති සෑදිය හැකි බව.

35. (1) මෙම ප්‍රඥප්තියේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට අනුශාංගික වන යම් කරුණකට අදාළ වන අවශ්‍ය යැයි නිසි බලධාරියා විසින් සලකනු ලබන රීති ද, ගුරුවර ගුරුවරියන්ට ගෙවනු ලබන දීමනා සහ දරුවන්ගෙන් අයකරනු ලබන ගාස්තුව ද නිසි බලධරයා විසින් සාදනු ලැබිය හැකිය.

(2) නිසි බලධරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ආණ්ඩුකාරවරයා විසින් උපදේශක කමිටුවේද නිර්දේශ ලබාගෙන අනුමත කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරන ලද රීති ආණ්ඩුකාරවරයා ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

ප්‍රඥප්තියේ කාර්ය ඉටු කරනු ලබන අයට හා ලියාපදිංචි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට වාර්ෂිකව දීමනාවක් ලබාදිය හැකි බව.

36. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා අදහස් කරන කවර හෝ පුද්ගලයෙකුගේ සේවය යම් නියමිත කාලසීමාවකට ලබාගත හැකි අතර, ආණ්ඩුකාරවරයා නියම කරනු ලබන දීමනාවක් ගෙවිය හැකිය. එසේම උපදේශක කමිටුවේ නිර්දේශය මත, නිසි බලධාරියාගේ අනුමැතිය මත වාර්ෂිකව යම් දීමනාවක් ලියාපදිංචි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට ලබාදිය හැකිය.

37. ආණ්ඩුකාරවරයා විසින් හෝ උපදේශක කමිටුව විසින් නිසි බලධාරියාට යම් නියෝගයක්, උපදෙසක්, මගපෙන්වීමක් කළහොත් ඒ අනුව කටයුතු කිරීමට ද යම් වාර්තාවක් හෝ ලේඛනයක් ඉල්ලා සිටියහොත් එය ලබාදීමට ද නිසි බලධාරියා විසින් කටයුතු කළ යුතුය.

*8 කොටස*

**වැරදි හා දණ්ඩන**

38. මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සම්පාදනය කරන ලද නියෝග හෝ විධිවිධාන හෝ උල්ලංඝනය කිරීම, කඩ කිරීම හෝ එම විධිවිධාන අනුව ක්‍රියාකිරීමේ බලය ඇති අයෙකුට තම රාජකාරි කටයුතු ඉටු කිරීමට බාධාකිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය. අන්තර්කාලීන විධිවිධාන.

39. එවැනි වරදක් සිදුකරන සෑම තැනැත්තෙකුටම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබුවහොත් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහදාහක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

40. 2009 අංක 01 දරන ඌව පළාතේ අධ්‍යාපන පද්ධතිය මගින් පරිච්ඡින්න කරනු ලැබේ.

41. *අර්ථ නිරූපනය* ;

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාතේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා ද,

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 අ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද ඌව පළාත් සභාව ද,

"නිසි බලධාරියා" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ නිසි බලධාරියා වශයෙන් විධිමත්ව පත්කර ඇති නිලධාරියාද ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට නිසි පරිදි බලයලත් නිලධාරියා ද,

"උපදේශක කමිටුව" යන්නෙන් පූර්ව ළමාවිය සංවර්ධන උපදේශක කමිටුව ද,

"කළමනාකරුවන් " යනුවෙන් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන ව්‍යවසායකයන් ද,

"පූර්ව ළමාවිය සංවර්ධන මධස්ථානවල ගුරුවර ගුරුවරියන් " යනුවෙන් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල උගන්වන ගුරුවර ගුරුවරියන් ද,

"විශේෂ ළමුන් " යනුවෙන් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට යා යුතු වයසේ සිටින පෙනීම, ඇසීම, දුබලවීම, කායික ආබාධිත තත්වයන් හා සෙමෙන් මනස වැඩෙන දරුවන් ආදී විශේෂිත ළමුන් ද,

"පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යන තැනැත්තෙකු " යනුවෙන් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන පුද්ගලයෙකු, ව්‍යවසායකු හෝ ස්වේච්ඡා සංවිධානයක් හෝ සංස්ථාගත ආයතනයක් ද,

"පළාත" යනුවෙන්, මොණරාගල, බදුල්ල යන පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 8 වැනි උපලේඛනයේ සඳහන් ඌව පළාත යන අර්ථය ද,

"නියමිත දිනය" යනුවෙන් මෙම ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය ද, අදහස් වේ.

42. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එකී සිංහල පාඨය බල පැවැත්විය යුතුය.

*1 වන උපලේඛනය*

**පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන / දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ලියාපදිංචි කිරීම / අළුතින් ඇරඹීම සඳහා ඉල්ලුම් පත්‍රය)**

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.*

1. ඉල්ලුම් පත්‍රය ලැබූ දිනය :-
2. භාරගත් නිලධාරියාගේ අත්සන :-
3. ගෙවන ලද ලියාපදිංචි ගාස්තුව :-
4. මුදල් භාරගත් කුවිතාන්සියේ අංකය :-
5. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය / දිවා සුරැකුම් මධ්‍යස්ථානය, ලියාපදිංචි කළ දිනය :-
6. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය/ දිවා සුරැකුම් මධ්‍යස්ථානය, ලියාපදිංචි කරන ලදී/නොලදී :-

1. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට අදහස් කරන ස්ථානය :-
2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-
3. ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා අංකය :-
4. අධ්‍යාපන කලාපය :-
5. අධ්‍යාපන කොට්ඨාශය :-
6. දැනට පවත්වාගෙන යන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ද ?
7. අළුතින් ආරම්භ කරන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ද ?
8. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ නම :-
9. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ අයිතිකරුගේ/පාලක මණ්ඩලයේ/ස්වේච්ඡා සංවිධානයේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ නම හා ලිපිනය :-
10. අළුතින් ආරම්භ කරන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් නම් ආරම්භ කිරීමට යෝජිත දිනය :-
11. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලේ කාමරවල වර්ග ප්‍රමාණය වර්ග අඩි :-
12. අපේක්ෂිත/දැනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව :-
13. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සිටින/යොදවා ගැනීමට අපේක්ෂිත ගුරුවර, ගුරුවරියන්ගේ තොරතුරු :

| | නම | ලිපිනය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| I. | | | |
| II. | | | |
| III. | | | |

14. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සහායිකාවන් සිටින්නේ නම් සංඛ්‍යාව :-
15. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන මාධ්‍ය හෝ මාධ්‍යයන් :-
16. පානීය ජල පහසුකම්/විදුලිය/වැසිකිළි පහසුකම් තිබේ ද ?

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

_______________________,

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————— නම :———————

06-15/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.